Weekly school Department of Education, Sabaragamuwa Province/ Weekly school Department of Education, Sabaragamuwa Province/ Weekly school Department of Education, Sabaragamuwa Province/ Weekly school Department of Education, Sabaragamuwa Province/ Weekly school Department of Education, Sabaragamuwa Province/ Weekly school Department of Education, Sabaragamuwa Province/ Weekly school Department of Education, Sabaragamuwa P

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

සතිය - 14 වන සතිය

විෂය - පෙරදිග සංගීතය

ශ්‍රේණිය - 07

සැකසුම - අචලා දිසානායක මිය
ර/බළ/ආනන්ද මෛත්‍රෙය මධ්‍ය මහා විද්‍යාලය

## පාඩම :- දරු නැළවිලි ගී ගායනය.



දරුණු නැළවිලි ගී යනු,

- ලෝකයේ පවතින ඉතා පැරණිම ගීත විශේෂයක් ලෙස දරු නැළවිලි ගී හැඳින්විය හැකිය.
- සෑම රටකටම ආවේණික වූ ජන ගී අතරින් වඩාත් වැදගත් ස්ථානයක් නැළවිලි ගීවලට හිමිවේ.
- නැළවිලි ගී පරම්පරාවෙන් පරම්පරාවටට පැවත ආ සාමාජීය, සංස්කෘතික උරුමයකි.
- ගෝත්‍රික ජන සමාජවල මෙන්ම, වැදි ජනයා අතර ද, දියුණු වූ ජන සමාජව වල ද, ප්‍රබන්ධ ව පැවැති හා තවමත් පවතින ගීත විශේෂයකි.
- පැරණියන් දරුවන් නැළවූයේ ලණුවක හෝ වැල් පටක හෝ වීත්තයක් බැඳ, සතර කොනෙහි එල්ලා තොටිල්ලක් සාදා, ඒ තුළ දරුවා තබා, පද්දමින් ගීත ගයමිනි.
- දරු සෙනෙහස උතුරා යන ආකාරයට ගායනා කරන නැලවිලි ගීත වල නාද රටා ලයාන්විත බවින් හා රිද්මයානුකූල බවින් ඉතා ඉහළ මට්ටමක ඇත.
- මෙම නාදමාලා දරුවාට මානසික සුවදායක බවක් ගෙනදීමට සමත් ව ඇත.
- බොහෝ දරු නැළවිලි ගී ආරම්භ වන්නේ

  **"දොයි දොයි දොයිය බබා
  බයි බයි බයිය බබා"**

  වැනි වචනවලිනි.

- පහත දැක්වෙන්නේ ද දරු නැළලැවිලි ගීයකි.

  **දෑතේ වළලුත් නැකෝ
  දෙපයේ ගිගිරිත් නැකෝ
  අම්මා එයි දැන් හනිකෝ
  නාඩන් සුරතල් මැණිකෝ**

- අම්මා කුඹුරේ, හේනේ වැඩට යන්නට ඇත. දරුවා බලාගන්නේ ආච්චි අම්මා, නැන්දා, ලොකු අම්මා විය හැකිය. අඩන දරුවන් නළවන්නෙ අම්මා හනිකට එයි කියමිනි.
- “මැණිකෝ” යන වචනයෙන් ආමන්ත්‍රණය කරයි.
- මෙහි භාෂාව සරලව යොදා ඇත. දරුවාට නිදි සුවය ලැබීමටත් සුරංගනා ලෝකයක් මැවීමටත් මෙම පදවැල් සමත්වී ඇත.
- මෙම ගීත මව සහ දරුවා අතර පවතින දැඩි ස්නේහය ආදරය පෙන්වන කැඩපතක් වේ.
- යොදාගත් වචන වල මටසිලුටු බවක් හා අර්ථාන්විත බවක් ඇත.

**දෝයි අම්මා දොයි දොයියෝ**
**බායි අම්මා බයි බයියෝ**
**බායි බයියන් බයිය දුවේ**
**දෝයි දොයියන් දොයිය දුවේ**
**නාඩා නිදියන්න දුවේ**
**අම්මා නුඹෙ ඒවි දුවේ**

දරු නැලවිලි ගී ප්‍රස්තාර

**සොළොස්මත් පැදි**

**මහ හනිතිත**

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| / | | | | / | | | | / | | | | / | | | |
| ප | ම | ම | ම | ම | – | – | – | ම | ප | පධප | ම | ග | – | – | මගරි |
| දො | යි | දො | යි | දො | යි | S | S | දො | යි | යSS | බ | බෝ | S | S | SSS |
| රි | ස | ස | රි | ග | – | – | මගරි | ග | රි | ස | රි | ස | – | – | – |
| බ | යි | බ | යි | බ | යි | S | SSS | බ | යි | ය | බ | බෝ | S | S | S |
| ස | ම | ම | – | ම | – | – | – | ම | ධ | පධප | ම | – | – | – | මගරි |
| උ | ඩ | නි | ය | රෙන් | S | S | S | වැ | ටී | SSS | ගෙ | නේ | S | S | SSS |
| රි | ස | ස | රි | ග | – | – | මගරි | ග | රි | ස | රි | ස | – | – | – |
| මි | ටි | නි | ය | රෙන් | S | S | SSS | වැ | ටී | S | ගේ | නේ | S | S | S |
| ස | ම | ම | – | ම | – | – | – | ම | ධ | පධප | ම | – | – | – | මගරි |
| ක | ල | වි | ට | බො | ල් | S | S | පො | ලා | SSS | ගෙ | නේ | S | S | SSS |
| රි | ස | ස | රි | ග | – | – | මගරි | ග | රි | ස | රි | ස | – | – | – |
| එ | යි | අ | ම් | මා | S | S | SSS | වි | ග | ස | කි | නේ | S | S | S |

### සොළොස්මත් පැදි

### මහ තනිතිත

| / | | | | / | | | | / | | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ස | ග | රි | සග | රි | – | – | – | රි | ස | ස | රි | ග | රිස | – | – |
| දෝ | ऽ | යි | අම් | මා | ऽ | ऽ | ऽ | දො | යි | දො | ය | යෝ | ऽऽ | ऽ | ऽ |
| ස | ග | රි | සග | රි | – | – | – | රි | ස | ස | රි | ග | රිස | – | – |
| බා | ऽ | යි | අම් | මා | ऽ | ऽ | ऽ | බ | යි | බ | ය | යෝ | ऽऽ | ऽ | ऽ |
| ස | ග | රි | සග | රි | – | – | – | රි | ස | ස | රි | ග | රිස | – | – |
| බා | ऽ | යි | බයි | ය | න් | ऽ | ऽ | බ | යි | ය | දූ | වේ | ऽऽ | ऽ | ऽ |
| ස | ග | රි | සග | රි | – | – | – | රි | ස | ස | රි | ග | රිස | – | – |
| දෝ | ऽ | යි | දොයි | ය | න් | ऽ | ऽ | දො | යි | ය | දූ | වේ | ऽऽ | ऽ | ऽ |
| ස | ග | රි | සග | රි | රි | – | – | රි | ස | ස | රි | ග | රිස | – | – |
| නා | ऽ | ඩ | ऽऽ | නි | දි | ऽ | ऽ | ය | න් | න | දූ | වේ | ऽऽ | ऽ | ऽ |
| ස | ග | රි | සග | රි | රි | – | – | රි | ස | ස | රි | ග | රිස | – | – |
| අ | ම් | මා | ऽऽ | නු | ඹෙ | ऽ | ऽ | ඒ | ऽ | වි | දූ | වේ | ऽऽ | ऽ | ऽ |

<u>පැවරුම</u>

1. ගැමි ගී යනු මොනවාද?
2. ඔබ දන්නා දරු නැළවිලි ගීත දෙකක් ලියන්න.
3. දරු නැළවිලි ගීත වල ඔබ හඳුනා ගත් ලක්ෂණ තුනක් ලියන්න.
4. ඔබ කැමති දරු නැළවිලි ගීතයක අවස්ථාවක් චිත්‍රයට නගන්න.
5. ද්‍රවිඩ, වැදි වැනි විවිධ පුද්ගලයින්ට අයත් දරු නැළවිලි ගී පිළිබඳව කරුණු සොයන්න.